සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි
ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි
ඛණ්ඩ - 2 සේවා ගණය
(MN 5 - 2006 - ඒ)
සඳහා වන
බඳවා ගැනීම් පරිපාටිය.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

21 DEC 2012
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
කොළඹ 10.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/5/1/13/1/2011
ඔබේ අංකය / உமது இல. / Your No.: 06/C/01/2010

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

දිනය / திகதி / Date: 2012. 12. 17

19 DEC 2012
Ministry of Health

Deputy Director General (Admin.)
20 DEC 2012

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

D/6

MN -5-2006 (ඒ) වැටුප් පරිමාණ නියම කර ඇති තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

උක්ත කරුණ සම්බන්ධ ඔබගේ සමාංක හා 2012.11.30 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ MN - 5-2006 (ඒ) වැටුප් පරිමාණය හිමි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ඩබ්.බී.පී. සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් - 01. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල්

දුරකථන) 2698475
தொலைபேசி) 2698490
Telephone) 2698507

ෆැක්ස්) 2692913
பெக்ஸ்) 2693869
Fax)

විද්‍යුත් තැපැල)
மின்னஞ்சல் முகவரி) postmaster@health.gov.lk
e-mail)

වෙබ් අඩවිය)
இணையத்தளம்) www.health.gov.lk
website)

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

මගේ අංකය) DDG(A)I/SOR/05/2011(VOL1)
எனது இல)
My No.)

ඔබේ අංකය)
உமது இல)
Your No.)

දිනය) 2013.01. 22
திகதி)
Date)

23 JAN 2013

අධ්‍යක්ෂ (පාලන) 06

<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ-2 සේවා ගණය MN-5-2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවන ලද අංක PSC/EST/5/1/13/1/2011 හා 2012.12.17 දිනැති ලිපියේ මුල් පිටපත හා MN-5-2006(ඒ) බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත් මේ සමඟ එවමි.

2. ඉහත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපතක් ලැමිනේටින් හා බයින්ඩින් කර ඔබගේ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුය.

වී. වික්‍රමරාජා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01

පිටපත් : 1. අතිරේක ලේකම් (පාලන) - කරු.පිටපතක් අමුණා ඇත.
2. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු.පිටපතක් අමුණා ඇත.
3. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)- සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියට ඇතුලත් කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් අමුණා ඇත.
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන) - පිටපතක් අමුණා ඇත.
5. අධ්‍යක්ෂ (පාලන) 05 - මධ්‍යම පරිපාලන ශාඛාවේ සුරක්ෂිතව තබා ගැනීම සඳහා පිටපතක් අමුණා ඇත.
6. අධ්‍යක්ෂ (විභාග)- කාර්යක්ෂමතා කඩඉම් හා අනිකුත් උසස්වීම් විභාග සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් අමුණා ඇත.

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

05. වැටුප්

5.1 **වැටුප් කේත අංකය** : MN 5-2006 (අ)

5.2 **වැටුප් පරිමාණය** : රු.16,720 -10 x 320 - 11 x 365 -15 x 450 -30,685

5.3 **ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර**

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	ආරම්භක වැටුප් තලය (රු.)
II	පියවර 01	රු.16,720
I	පියවර 12	රු.20,285

සටහන: නව බඳවා ගැනීම් කළ යුත්තේ ආරම්භක ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරටය.

06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 **අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :**

අනු අංකය	අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	කාර්යයන්
01.	පෝෂණවේදී	45	* රෝහල් වල නේවාසික රෝගීන් හා බාහිර රෝගීන් සඳහා විශේෂ ආහාර සැලසුම් කිරීම හා උපදෙස් දීම. * මුළුතැන්ගෙයි සෞඛ්‍යය හා ආහාර පිළිබඳව කටයුතු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමින් එහි කාර්ය මණ්ඩලයට පූර්ව සේවා සහ සේවාස්ථ පුහුණුවක් ලබා දීම. * ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි.
02.	මනෝ වෛද්‍ය සමාජ සේවක	55	* මානසික රෝගීන්ට අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීම, ප්‍රජා මනෝ වෛද්‍ය සේවාව, මානසික සෞඛ්‍ය අධ්‍යාපනය මානසික රෝගීන් සඳහා සුභ සාධන කටයුතු සහ පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. * ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි.
03.	සැලසුම් හා වැඩසටහන් නිලධාරි	15	* සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ දත්ත රැස් කිරීම. * සංවර්ධනය සඳහා යටා දර්ශණ සකස් කිරීම. * ආයතනවල කාර්යසාධන වාර්තා සකස් කිරීම. * පළාත්, කොට්ඨාශ සෞඛ්‍ය සැලසුම් සකස් කිරීම. * ව්‍යාපෘති නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අය වැය පරීක්ෂා කිරීම / හරි වැරදි බැලීම. * වැඩ සටහන් සැලසුම් කිරීමට අදාළ වාර්තා සහ දත්ත පදනම් පිළියෙල කිරීම. * ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි.

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි
ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධාරී ඛණ්ඩ 2 සේවා ගණය (MN-5-2006(ඊ)) සඳහා වන
බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1	දෙපාර්තමේන්තුව : අදාල නොවේ	යොමු අංකය :	දිනය :
1.2	අමාත්‍යාංශය : සෞඛ්‍ය	යොමු අංකය : 06/C/ 01/2010	දිනය :2012.11
1.3	කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම	යොමු අංකය : DMS/C/08/45	දිනය : 2012.0
1.4	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය	යොමු අංකය : EST-3/RECRU/04/6637	දිනය:2010.05.
1.5	ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය	යොමු අංකය : NSCC/2/3/1/3/21	දිනය:2010.04. සහ 2011.12.
1.6	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය	යොමු අංකය : PSC/EST/5/1/13/1/2011	දිනය 2012.07.

02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 **පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේඃ

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 **සේවා ගණය** : ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 02

3.2 **ශ්‍රේණි** : II සහ I

3.3 **පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය** : සෞඛ්‍ය අමාත්‍යාංශය / සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන රෝහල් හා ආයතනයන්හි රෝගී සත්කාර සේවයට සහය වන්නාවූද, ආයතනයන්හි විධායක ගණයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කාර්ය පවරනු ලබන්නාවූද , සේවා ගණයකි.

3.4 **කාර්යයන් පැවරීම** : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයෙ පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර , විශ්‍රාම වැටුප් සහිත

04.	වෛද්‍ය ලේඛණ නිලධාරි	32	* සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යා ලේඛන පිළිබඳ දත්ත රැස්කරම. * අභ්‍යන්තර ගිලන්වීමේ සහ මරණ සංඛ්‍යා පිළිබඳ ලේඛන පවත්වා ගෙ යාම, ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම හා ජාත්‍යන්තර රෝගී වර්ගීකරණයට අනුකූලව ඒවා ඇතුළත් කිරීම. * මාසික , ත්‍රෛමාසික සහ වාර්ෂික වාර්තා සකස් කිරීම. * මාසික රෝහල් ප්‍රකාශන පිළියෙල කිරීම, රෝහල්වල /සෞඛ්‍ය ආයතනවල වෛද්‍ය වාර්ථා සේවා සකස් කිරීම , සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. * වෛද්‍ය සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය ඉඩකඩ සහ උපකරණ සැළසුම් කිරීම, අනු ලේඛණ සහ පිටපත් කිරීමේ සේවා සංඛ්‍යා ලේඛන ආකෘති සැළසුම් කිරීම, දත්ත සම්බන්ධීකරණ පද්ධති තීරණය කිරීම. * රෝගී සත්කාර සේවයට අදාළ සියලුම වාර්තා සහ දර්ශන පද්ධති සම්බන්ධීකරණ කටයුතු කිරීම. * වාර්තා පාලනය කිරීම, රැස්කර තබා ගැනීම සහ ඒවා නැවත ලබා ගැනීම පිළිබඳ ක්‍රියා පිළිවෙත් ස්ථාපනය කිරීම. * ආයතන ප්‍රධානින් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි .
05.	සංඛ්‍යාති සමීක්ෂණ නිලධාරි	01	* කාර්යාල වල සැළසුම් අංශයේ දත්ත ඒකරාශී කිරීම, ව්‍යුහගත කිරීම * විශ්ලේෂණය කිරීම, වාර්ෂික සැලැස්ම සකස් කිරීම. * ප්‍රගති වාර්ථා සකස් කිරීම. * ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි.
06.	හෘද පෙනහළු නිවේශක	39	* හෘද ශල්‍ය කර්මයක් කරන අවස්ථාවේදී හෘදයේ ක්‍රියාකාරීත්වය නත කිරීම, හෘද පෙනහළු යන්ත්‍රය මඟින් අඛණ්ඩ රුධිර සැපයුමක් ලබා දීමෙන් මොළයේ සහ ශරීරයේ සියළුම පටක වල සජීවී ක්‍රියාකාරීත්ව නිසියාකාරව පවත්වා ගැනීම සහ හෘදය නැවත ක්‍රියාත්මක කිරීම අ කටයුතු කිරීම. * ආයතන ප්‍රධානින් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි .

අනු අංකය	අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව
01.	පෝෂණවේදී	45
02.	මනෝ වෛද්‍ය සමාජ සේවක	55
03.	සැළසුම් හා වැඩසටහන් නිලධාරි	15
04.	වෛද්‍ය ලේඛණ නිලධාරි	32
05.	සංඛ්‍යාති සමීක්ෂණ නිලධාරි	01
06.	හෘද පෙනහළු නිවේශක	39

6.3 **ඒකාබද්ධ නිලධර** සංඛ්‍යාව : එක් එක් තනතුරට අදාළව ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා II, ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

අනු අංකය	අනුමත තනතුර	ධාරාව	ප්‍රතිශතය
01.	පෝෂණවේදී	විවෘත	100%
		සීමිත	නැත
		කුසලතා	නැත
02.	මනෝ වෛද්‍ය සමාජ සේවක	විවෘත	100%
		සීමිත	නැත
		කුසලතා	නැත
03.	සැලසුම් හා වැඩසටහන් නිලධාරී	විවෘත	100%
		සීමිත	නැත
		කුසලතා	නැත
04.	වෛද්‍ය ලේඛණ නිලධාරී	විවෘත	100%
		සීමිත	නැත
		කුසලතා	නැත
05.	සංඛ්‍යාති සමීක්ෂණ නිලධාරී	විවෘත	100%
		සීමිත	නැත
		කුසලතා	නැත
06.	හෘද පෙනහළු නිවේශක	විවෘත	50%
		සීමිත	50%
		කුසලතා	නැත

*** සටහන:** හෘද පෙනහළු නිවේශක තනතුර සඳහා විවෘත හා සීමිත බඳවා ගැනීම සඳහා එකම ලිඛිත විභාගයක් පවත්වන අතර , එහිදී ලබා ගන්නා ලකුණු විවෘත හා සීමිත ලෙස වර්ග කර, පවතින පුරප්පාඩු අනුව ඉහළම ලකුණු ලබා ගන්නා සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් විවෘත 50% හා සීමිත 50% ලෙස බඳවා ගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 **අධ්‍යාපන සුදුසුකම්** : එක් එක් තනතුරට අදාළ වන සුදුසුකම් **ඇමුණුම** 01 දැක්වේ.

7.2.2.2 **වෘත්තීය සුදුසුකම්** : අදාළ නොවේ.

7.2.2.3 **පළපුරුද්ද** : එක් එක් තනතුරට අදාළ වන සුදුසුකම් **ඇමුණුම** 01 දැක්වේ.

7.2.2.4 **කායික සුදුසුකම්** : දේශයෙහි ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදවීමට තරම් යෝග්‍ය වන යහපත් මානසික හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම.

7.2.2.5 **වෙනත්** :
(i) අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අයදුම්කරුවන් විසින් සියළු සුදුසුකම් සපුරා තිබිය යුතුය.
(ii) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(iii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 **අවම සීමාව** : අවුරුදු 21 ට නොඅඩු

7.2.3.2 **උපරිම සීමාව** : අවුරුදු 35 ට නොවැඩි

(හෘද පෙනහළු නිවේශක තනතුරට වන සීමිත බඳවා ගැනීම් සඳහා පමණක් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

7.2.4 **බඳවා ගැනීමේ ක්‍රමය** : ලිඛිත විභාගයක් මගින්

7.2.4.1 **ලිඛිත විභාගය**

විෂයයන්	**උපරිම ලකුණු ප්‍රමාණය**	**සමත් ලකුණු ප්‍රමාණය**
බුද්ධි පරීක්ෂණය	100	40%
පොදු ප්‍රශ්න පත්‍රය	100	40%

සටහන:

ලිඛිත විභාගය පිළිබඳ විස්තර **ඇමුණුම - 02** හි ඇත.

7.2.4.1.1 **පවත්වන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 **වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ.

7.2.4.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.2.4.3.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

7.2.4.4 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** : අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම් : හෘද පෙනහළු නිවේශක තනතුර සඳහා පමණි.

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධියක්.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් ඇති හෙද/හෙදි නිලධාරියෙකු වීම.

7.3.2.4 **කායික සුදුසුකම්** : දේශයෙහි ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදවීමට තරම් යෝග්‍ය වන යහපත් මානසික හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම.

7.3.2.5 **වෙනත්** : අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට අයදුම්කරුවන් විසින් සියළු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

7.3.3 **බඳවා ගැනීමේ ක්‍රමය** : ලිඛිත විභාගයක් මඟින්

7.3.3.1 **ලිඛිත විභාගය**

විෂයයන්	**උපරිම ලකුණු ප්‍රමාණය**	**සමත් ලකුණු ප්‍රමාණය**
බුද්ධි පරීක්ෂණය	100	40%
පොදු ප්‍රශ්න පත්‍රය	100	40%

සටහන:

ලිඛිත විභාගය පිළිබඳ විස්තර **ඇමුණුම - 02** හි ඇත.

7.3.3.1.1 **පවත්වන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.3.3.2 **වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ.

7.3.3.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)**
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.3.3.3.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

7.3.3.4 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** : අදාළ නොවේ

7.3.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 **කුසලතා මත බඳවා ගැනීම** : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග	කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද	කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය /සහතිකපාඨමාලා/ වෙනත්
1 වන කාර්යක්ෂමතා කඩඉම	II ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගත වීමට පෙර	ලිඛිත පරීක්ෂණය - ඇමුණුම 03
2 වන කාර්යක්ෂමතා කඩඉම	I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර	ලිඛිත පරීක්ෂණය - ඇමුණුම 04

8.2 **කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :** වසරකට දෙවරක්

8.3 **කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :**

1 වන කාර්යක්ෂමතා කඩඉම :
2 වන කාර්යක්ෂමතා කඩඉම :
} සෞඛ්‍යඅමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

ශ්‍රේණිය	ලබාගත යුතු ප්‍රවීණතාවය
1. රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.
2. අනෙක් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 **III වන ශ්‍රේණියේ සිට II-ශ්‍රේණියට උසස් කිරීම :** අදාළ නොවේ.

10.2 **II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අනුමත කාර්යසාධන ඇගයීමේ පර්පාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව

10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම

(ii) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ම නියමිත දිනට උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධනය ඇගයීමේ පර්පාටිය අනුව පූර්වාසන්නතම වසර හය (06) තුළම සුවිශේෂී කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස්කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබා ගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය : ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත්කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝගතා පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත් වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත්කිරීමේ දින සිට වසර හය (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

(අභියෝගතා පරීක්ෂණය පිළිබඳ විස්තර **ඇමුණුම 05** හි ඇත.)

සංලක්ෂය : 1.සුවිශේෂී කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්යසාධන ඇගයීමේ දී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

2. සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සටහන:

1. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබාගත යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර, නිලධරයකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.

2. නිලධරයකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දින වේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම : අදාළ නොවේ.

11. **තනතුරුවලට පත් කිරීම :** අදාළ නොවේ.

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරබාහිර වන්නා වූ කොන්දේසි :**

මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත්කිරීම් / බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

1. **"සතුටුදායක සේවා කාලය"** යනු : රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාර්ය ඉටු කිරීම මගින් ද , සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වීම මගින් ද , ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද එම කාලය තුළ දී උපයා ගතව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඒ කාලය තුල කල වරදකට (අවවාද කිරීමක් හෝ) ඔහු විසින් දඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාව වන්නේය.

II. **"සක්‍රිය සේවා කාලය"** යනු : ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. **මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.**

15. **සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම:** අදාළ විස්තර ඇමුණුම 06 හි ඇත.

[illegible] කළේ අත්සන : ....[signature]..........
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එම්.ඒ.ආර්.පී. අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ අත්සන : ....[signature]..........
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2012.11.29

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........Y.S.N. Jamuthilaka..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ....
තනතුර : ....
දිනය : ....
නිල මුද්‍රාව : ....

[illegible] : 2012/11/30

[illegible] අංකය : 06/C/01/2010

[illegible] අමාත්‍යාංශයෙ හි ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ 02 සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය [illegible] කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..........Y.S.N. Jamuthilaka..........
නම : වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

[illegible] : 2012/11/30

නිල මුද්‍රාව : ....

යොමු අංකය : PSC/EST/5/1/13/1/2011

[illegible] අමාත්‍යාංශයේ.......... හි ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ 2 .... සඳහා වන මෙම බඳවා [illegible] පරිපාටිය ...2012. 07. 27...... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ....[signature]..........
නම : ....
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව : ....

[illegible] : 2012.12.14

ඇමුණුම -01

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-5-2006(ඊ)) සඳහා

අදාළ තනතුරු වලට විවෘත බඳවා ගැනීම් සඳහා අදාළ වන සුදුසුකම්.

අනු අංකය	තනතුර	සුදුසුකම්
01.	පෝෂණවේදී	* **අධ්‍යාපන සුදුසුකම් :-** (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව පළවෙනි පංතියේ හෝ දෙවැනි පන්තියේ විශේෂ උපාධියක් ලබා තිබීම. හෝ (ii) (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයයක් ලෙස විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පළවෙනි පංතියේ හෝ දෙවැනි පන්තියේ සාමාර්ථයක් සහිතව ලබා තිබීම. සහ (ආ) ආහාර පෝෂණවේදය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. හෝ (iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව විශේෂ (ආහාර තාක්ෂණය හා පෝෂණය) උපාධිය පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිතව ලබා තිබීම. හෝ (iv) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පෝෂණවේදය හෝ ආහාර විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.
02.	මනෝ වෛද්‍ය සමාජ සේවක	* **අධ්‍යාපන සුදුසුකම් :-** (i) (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව, සමාජ මානව විද්‍යාව හෝ මනෝ විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් ලබා තිබීම. හෝ (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමඟ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය ආයතනයකින් මෙහෙය වූ සය (06) මාසික මනෝ වෛද්‍ය සමාජ සේවා වැඩ පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම හා ඉන් පසුව මනෝ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ මානසික සෞඛ්‍ය ඒකකයක අවුරුදු 02 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

03.	සැලසුම් හා වැඩ සටහන් නිලධාරී	* **අධ්‍යාපන සුදුසුකම් :-** (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයයක ගණිතය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, සත්ව විද්‍යාව, සමාජ විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ කිපයක් සමඟ උපාධිය සමත් වී තිබීම. සහ (ii) රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව පිළිබඳව වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.
04.	වෛද්‍ය ලේඛණ නිලධාරී	* **අධ්‍යාපන සුදුසුකම් :-** (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයයක ආර්ථික විද්‍යාව හෝ ගණිතය හෝ සංඛ්‍යා ලේඛන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව උපාධියක් ලබා තිබීම. සහ (ii) රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව පිළිබඳව වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.
05.	සංඛ්‍යාති සමීක්ෂණ නිලධාරී	* **අධ්‍යාපන සුදුසුකම් :-** (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයයක ආර්ථික විද්‍යාව, ගණිතය, සංඛ්‍යා ලේඛණ විද්‍යාව හෝ සත්ව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව උපාධියක් ලබා තිබිය යුතුය. සහ (ii) රජයේ පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව පිළිබඳව වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.
06.	හෘද පෙනහළු නිවේශක	* **අධ්‍යාපන සුදුසුකම් :-** (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබාගත් භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇති පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

සකස් කළේ :
අත්සන : ....
නම : එම්.ඒ.ආර්.පී. අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන) VI
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : 2012.11.29

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ....
තනතුර : ....
දිනය : 2012/11/..
නිලමුද්‍රාව : ....
කොළඹ 10.

ඇමුණුම - 02

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-5-2006(ඒ)) සඳහා

අදාළ තනතුරු වල බඳවා ගැනීම් පරිපාටිය

(i) **විභාගයේ නම** : විවෘත තරඟ විභාගය සහ අභ්‍යන්තර බඳවා ගැනීම සඳහා වු සීමිත තරඟ විභාගය.

(ii) **විභාගය පිළිබඳ විස්තර** :

ප්‍රශ්න පත්‍රය	කාලය	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
1. බුද්ධි පරීක්ෂණය	පැය 01 1/2යි	100	40%
2. පොදු ප්‍රශ්න පත්‍රය	පැය 03යි	100	40%

(iii) **විභාගය පවත්වනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

(iv) **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : තනතුරු වල පුරප්පාඩු ඇති වීම මත

(v) **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1. බුද්ධි පරීක්ෂණය	පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
2. පොදු ප්‍රශ්න පත්‍රය	ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධව සාමාන්‍ය දැණුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

සටහන:

මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% ක් වත් අපේක්ෂකයා විසින් ලබා ගත යුතුය. තරඟ විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි, ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් බඳවා ගනු ලැබේ.

සකස් කළේ :
අත්සන : ....
නම : එම්.ඒ.ආර්.පී. අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන) VI
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : 2012.11.29

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ....
තනතුර : ....
දිනය : 2012/11/30
නිලමුද්‍රාව : ....

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, "සුවසිරිපාය"

ඇමුණුම - 03

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-5-2006(ඒ)) සඳහා

අදාළ තනතුරු වල බඳවා ගැනීම් පරිපාටිය

(i) විභාගයේ නම : පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

(ii) විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්ණ පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
1. කාර්යාල ක්‍රම	පැය 02යි	100	40 %
2. ගිණුම් ක්‍රම	පැය 02යි	100	40 %
3. විෂයය බද්ධ කරුණු	පැය 02යි	100	40 %

(iii) **විභාගය පවත්වනු ලබන බලධරයා :** සෞඛ්‍යඅමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

(iv) **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** වසරකට දෙවරක්

(v) **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1 කාර්යාල ක්‍රම	තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිළි හා සංක්ෂිප්ත සටහන් මඟින් තම අදහස් /නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව මැන බැලීම. * **ආයතන සංග්‍රහයේ:-** 11 පරිච්ජේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි සහ පත් කිරීම් 111 පරිච්ජේදය - මාරු කිරීම් VII පරිච්ජේදය - වැටුප් VIII පරිච්ජේදය - අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා X11 පරිච්ජේදය - නිවාඩු X111 පරිච්ජේදය - දුම්රිය බලපත්‍ර XIV පරිච්ජේදය - දිවයින ඇතුළත රාජකාරි ගමන් XVI පරිච්ජේදය - නිවාඩු ගමන් XXVI I පරිච්ජේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග XXV111පරිච්ජේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි XXX පරිච්ජේදය - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල XLV11 පරිච්ජේදය - සාමාන්‍ය හැසිරීම සහ විනය

	* අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ III වැනි පරිච්ඡේදය - පත් කිරීම් V වැනි පරිච්ඡේදය - රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන් VI වැනි පරිච්ඡේදය - පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් කොන්දේසි VII වැනි පරිච්ඡේදය - පත් කිරීම් වලදී අනුගමනය කල යුතු පටිපාටිය VIII වැනි පරිච්ඡේදය - පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම XIV වැනි පරිච්ඡේදය - පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම XV වැනි පරිච්ඡේදය - තනතුර අතහැර යාම
2. ගිණුම් ක්‍රම	තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාල වල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත් වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම. **මුදල් රෙගුලාසියේ:-** I පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු. II පරිච්ඡේදය - වියදම්, අත්හැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාර බලය. III පරිච්ඡේදය - මුදල් පාලනය හා ගිණුම් ගත කල හැකි වීම. IV පරිච්ඡේදය - ලැබීම්. V පරිච්ඡේදය - ගෙවීම්. VI පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්
3. විෂයය බද්ධ කරුණු	රෝහල් පරිපාලනය පිළිබඳව තනතුරට අදාළ කාර්යයන් එක්රැස් කළ තොරතුරු විශ්ලේෂණය සකස් කොට බෙදා හැරීම, වාර්තා /ප්‍රගති වාර්තා සකස් කිරීම ඇතුළු ඒ ඒ තනතුරෙහි කාර්යභාරයට අදාළ දැනුම හා කුසලතා මැන බැලීමේ ප්‍රශ්ණ පත්‍රයකි.

සකස් කළේ :
අත්සන : ....
නම : එම්.ඒ.ආර්.සී. අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන) VI
දිනය : 2014/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : 2014.11.19

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ....
තනතුර : ....
දිනය : 2014/11/30
නිල මුද්‍රාව : ....

අධ්‍යක්ෂ ජනරාල් ... අමාත්‍යාංශය ... 385, "සුවසිරිපාය" කොළඹ 10.

1.

ඇමුණුම - 04

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-5-2006(ඒ)) සඳහා

අදාළ තනතුරු වල බඳවා ගැනීම් පරිපාටිය

i) විභාගයේ නම : දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

ii) විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	ලකුණු	සමත් ලකුණු
I. සිද්ධි අධ්‍යයනය	පැය 03යි	100	40 %

iii) විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍යඅමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

iv) විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

v) විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
I. සිද්ධි අධ්‍යයනය	අදාළ ක්ෂේත්‍රයට අදාළව නිර්මාණය කරනු ලබන ගැටළු සහගත සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්ණ කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. එමගින් අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය, නිර්මාණශීලිත්වය, ගැටළු විශ්ලේෂණය යනාදිය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව සහ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව ඔවුන් තුළ පවත්නා අවබෝධය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ.

සකස් කළේ :
අත්සන : ....
නම : එම්.ඩී.ආර්.ජී. අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන) VI
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : 2012.11.26

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ......අධ්‍යක්ෂ ජනරාල්......
තනතුර : ......අමාත්‍යාංශය......
දිනය : 2012/11/30 ...විමලවංශ හිමි මාවත, 385, "සුවසිරිපාය"
නිලමුද්‍රාව : ......කොළඹ 10......

ඇමුණුම - 05

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

කළමනාකරණ සහකාර /කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-5-2006(ඊ)) සඳහා

අදාළ තනතුරු වල බඳවා ගැනීම් පරිපාටිය

1.1 **විභාගයේ නම** : සුවිශේෂී කාර්යය සාධනය යටතේ I වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අභියෝගතා පරීක්ෂණය

1.2 **විභාගය පිළිබඳ විස්තර** :

ප්‍රශ්න පත්‍රය	කාලය	ලකුණු	සමත් ලකුණු
1. අභියෝගතා පරීක්ෂණය	පැය 01 1/2යි	100	60 %

1.3 **විභාගය පවත්වනු ලබන බලධරයා** : සෞඛ්‍යඅමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

1.4 **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට වරක්

1.5 **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1. අභියෝගතා පරීක්ෂණය	තමා වෙත පැවරෙන සියලු කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප මෙන්ම අපේක්ෂිත ප්‍රවීණතාවයක් අත්පත් කරගෙන තිබේද යන්න මැන බැලීමේ ලිඛිත පරීක්ෂණයකි.

සටහන:

විභාගයට පෙනී සිටිය යුතු මාධ්‍ය :

ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ-සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය වලින් පැවැත්වෙනු ඇත. අපේක්ෂකයන් තමන් සේවයට බැඳීමේ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවිය යුතුය. මෙවැනි විභාගයක් නොමැතිව සේවයට බඳවා ගෙන ඇති අය සේවයට ඇතුල්වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය.

සකස් කළේ :	පරීක්ෂා කළේ :
අත්සන :	අත්සන : ....
නම : එම්.ඩී.ආර්.පී. අභයගුණවර්ධන	නම : වී.වික්‍රමරාජා
තනතුර : අධ්‍යක්ෂ(පාලන) VI	තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : 2012/11/29	දිනය : 2012/11/29

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : වෛ. පී. ජී. මහිපාල ....

තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය ලේකම්, ...

දිනය : 2012/11/30 385, "සුවසිරිපාය" ....

නිල මුද්‍රාව : කොළඹ 10. ....

ඇමුණුම - 06

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-5-2006(ඒ)) සඳහා

අදාළ තනතුරු වල බඳවා ගැනීම් පරිපාටිය

(ක්‍රියාත්මක දිනට සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.)

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ [illegible] 06/2006 හා ඊට අනුෂංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති MN -05- 2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් [illegible] ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කළ යුතුය.

[illegible] ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වෙතුදු අන්තර්ග්‍රහණය [illegible] අදාළ නැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ නැනැත්තා අවසන් වරට [illegible] වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 .4 වගන්තිය අනුව ඊළඟ වැටුප් [illegible] ද සිදු නොකළ යුතුය.

(i) MN - 5 - II ශ්‍රේණිය

(අ) MN 5 - 2006 -A වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් වසර දහයක(10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර දහයක(10) සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්

MN - 5 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) MN -5 - I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයකට(10) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනිකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්

(ආ) MN .5 - 2006 -A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවය කරන නිලධාරීන්

MN -5 - I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ :
අත්සන : ....
නම : එම්.ජී.ආර්.සී. අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(ආයතන) VI
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : 2012. 11. 29

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : .... සේවා අධ්‍යක්ෂ ජනරාල්
තනතුර : .... අමාත්‍යාංශය
දිනය : 2012/11/29
නිල මුද්‍රාව : .... විමලවංශ හිමි මාවත,
385, 'සුවසිරිපාය'
කොළඹ 10.